# ආණ්ඩුවේ නිවේදන

### 1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 27(2) වැනි වගන්තිය යටතේ මහවැලි අධිකාරිය විසින් පනවනු ලබන රීති

1. මෙම රීති 1979 මහවැලි අධිකාරි රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ (මෙහි මින් මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) 26 වැනි වගන්තියේ විධිවිධාන යටතේ අධිකාරියේ පොදු මුදල් කාර්යයන් සඳහා පිහිටුවන ලද අරමුදල, මහවැලි අරමුදල (මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

3. අධ්‍යක්ෂ ජනරාල් විසින් එක් එක් වර්ෂයේ සැප්තැම්බර් මස පළමුවැනි දිනට වඩා ප්‍රමාද නොවන පරිදි නියම කරනු ලබන දිනයක දී අධිකාරියට ඉදිරි වර්ෂයේදී ලබාගත හැකිව ඇති ආදායම පිළිබඳ ඇස්තමේන්තුවක් හා යෝජිත වියදම් පිළිබඳ විස්තර ඇතුළත් වන අයවැය වාර්තාවක් ඔහු විසින් අධිකාරියට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

4. මෙහි 3 වැනි වගන්තියේ සඳහන් කරනු ලබන දිනයට අඩු වශයෙන් දින හතකට (7) පෙරාතුව ඒවැනි සෑම අයවැය වාර්තාවක්ම අධිකාරියේ අධ්‍යක්ෂවරුන් අතර බෙදා හැරිය යුතුය.

5. අධිකාරියට අයවැය ඉදිරිපත් කිරීමෙන් දින පහළොව (15) ක් ඇතුළත අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතර සංඛ්‍යාවකින් හා පසෙන් තුනක ඡන්දය ප්‍රකාශ කිරීමකින් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කිසියම් සංශෝධනයක් ඇතොත් එබඳු සංශෝධනද සහිතව අයවැය පිළිගනු ලැබිය යුතුය. එසේ වුවත්, එකී දින පහළොවක (15) කාලසීමාව තුළදී අධිකාරිය එලෙස කටයුතු කර නැත්නම් අධිකාරිය විසින් අයවැය පිළිගනු ලැබුවා සේ සලකනු ලැබිය යුතුය.

6. (අ) අධ්‍යක්ෂ ජනරාල් විසින් ඕනෑම අවස්ථාවක පරිපූරක අයවැයක් පිළියෙල කරනු ලැබ එය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(ආ) එවැනි ම පරිපූරක අයවැයක්ම ඉදිරිපත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමට අඩු වශයෙන් දින හතකට (7) පෙරාතුව එම අයවැය අධ්‍යක්ෂවරුන් අතරේ බෙදා හරිනු ලැබිය යුතුය.

7. අධිකාරිය වෙත ඉදිරිපත් කෙරෙන ඕනෑම පරිපූරක අයවැයකට 5 වැනි වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරවිය යුතුය.

8. සෑම අයවැයක්ම, එසේම සෑම පරිපූරක අයවැයක්ම 1971 අංක 38 දරණ මුදල් පනතේ 8 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

9. අධ්‍යක්ෂ ජනරාල්ට සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිඛිතව බලය පැවරෙන ඕනෑම තැනැත්තෙකුට, අයවැයෙන් හෝ ඕනෑම පරිපූරක අයවැයකින් අනුමතවන යම් බදු වියදමක් දැරීමට අවශ්‍ය මුදල් අරමුදලෙන් ආපසු ලබාගැනීමට බලය පවරනු ලැබිය යුතුය.

10. ඕනෑම වර්ෂයකදී, අවශ්‍යවන අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල් විසින් අයවැයෙහි හෝ ඕනෑම පරිපූරක අයවැයක ඕනෑම ශීර්ෂයක් යටතේ වියදම අඩු කිරීමට හෝ වැඩි කිරීමට හෝ එක් වියදම් ශීර්ෂයක් යටතේ නියමිත මුදල වෙනත් ශීර්ෂයකට මාරු කිරීමට හෝ හැකිය. එසේ වුවද, අයවැයෙන් හෝ ඕනෑම පරිපූරක අයවැයකින් අනුඥාත මුළු වියදම් ප්‍රමාණය ඉක්මවනු නොලැබිය යුතුය.

11. අධිකාරිය විසින් අනුමත කරනු ලබන ඕනෑම අයවැයකින් හෝ පරිපූරක අයවැයකින් අනුවේදිත වියදම දැරීම සඳහා වූ බලය එම අයවැය අදාළ කරවන මුදල් වර්ෂයේ අවසානයේදී අහෝසි විය යුතුය.

12. අධ්‍යක්ෂ ජනරාල් විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයෙන් පසුව හැකි තරම් ඉක්මනින් ඉකුත් වර්ෂය තුළදී තම පාලන කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක්, එම වර්ෂය තුළ අරමුදල පිළිබඳ තත්ත්වය හා එහි ලැබීම් හා ප්‍රතිලාභ ප්‍රමාණයන් දැක්වෙන සටහනක්ද සමග පිළියෙල කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව හා සටහන අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබ, අධිකාරිය විසින් ඒ පිළිබඳව සම්මත කරනු ලබන යෝජනාවක් වේනොත් එම යෝජනාවද සමග, එකී වාර්තාව හා සටහන මුල් වරට අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති හයක් (6) තුළදී අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

කොළඹ 10,
1979 දෙසැම්බර් 31 දින.

3-597—80.03.28 දින අංක 82 දරණ ගැසට් පත්‍රය